**රඹෑව ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 12 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 09 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2. තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රඹෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත. |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුලදී වටිනාකම රු.517,000 වූ පැරණි පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කර ඇති අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර නොතිබුණි. | ගිණුම් වලට ගැලපිය කළයුතු වේ. | ඉදිරිපත් කර නැත. |
| (ii) | 2017 වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.123,040 විගණන ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | උපචිත වියදම් ලෙස ගැලපීම් කළ යුතු වේ. | ඉදිරිපත් කර නැත. |

| | | | |
|---|---|---|---|
| (iii) | ගෙවිය යුතු විශ්‍රාම වැටුප් රු.843,637 ක් ගිණුම්ගත කර නොතිබුණි. | උපචිත වියදම් ලෙස ගැලපීම් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත. |
| (iv) | ගවමස් වෙළඳසැලකින් අයකර ගතයුතු රු.301,000 ක බදු කුලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් හදුනාගෙන ගිණුම් ගත කල යුතු වේ. | ඉදිරිපත් කර නැත. |
| (v) | ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් රු.150,000 වටිනා ඉඩම් 2 ක් සහ වටිනාකම තක්සේරු කර නොමැති ඉඩම් 3 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය හා ලෙජර් ගිණුම් යාවත්කාලීන කර ගිණුම්ගත කල යුතු වේ. වටිනාකම හදුනාගත නොහැකි වත්කම් තක්සේරු කර ගිණුම් ගත කල යුතු වේ. | ඉදිරිපත් කර නැත. |

(ඇ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සේවක ණය ලේඛනය අනුව අයකර ගත යුතු ණය ශේෂය රු.1,843,171 වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.1,555,133 ක් ලෙස දක්වා තිබුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසදා නිවැරදි කිරිම කටයුතු කලයුතු වේ.. | ඉදිරිපත් කර නැත. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පූර්ව වර්ෂ ගණනාවක සිට පැවත එන රු.1,407,014 ක් වූ ලැබිය යුතු ගිණුම් විෂයයන් 05 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ | ඉදිරිපත් කර නැත. |
| (ii) | පූර්ව වර්ෂ කිහිපයක සිට පැවත එන රු.1,948,507 ක්වූ ගෙවිය යුතු ගිණුම් විෂයයන් 10 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ | ඉදිරිපත් කර නැත. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.63,682,510 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව හිමිකම් සහතික, තක්සේරු වාර්තා, සමීක්ෂණ මණ්ඩල වාර්තා, ශේෂ සනාථ කිරීමේ ලිපි අයෝජන සහතික තොග ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරිපත් කර නැත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| (i) | රීති 33 | වරිපනම් ගෙවීම පැහැරහැරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදි පිළියෙල කර නොතිබුණි. | රීති අනුව කටයුතු කලයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ii) | රීති 217 හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති අනුව කටයුතු කලයුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

------------------------

| | | | |
|---|---|---|---|
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | ධාවන මට්ටමේ පවතින වාහන13 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කලයුතු වේ. | ඉදිරිපත් කර නැත. |
| (ii) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | රු.27,300 වැයකර ඇඟිලි සළකුණු යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කලයුතු වේ. | ඉදිරිපත් කර නැත |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,637,638 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,761,489 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------------

විගණනයට ඉදිරිපත් කර තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,546,000 | 1,394,480 | 1,093,965 | 943,643 | 736,000 | 1,294,050 | 365,812 | 643,128 |
| කුලී | 7,092,700 | 5,101,135 | 4,801,135 | 2,157,526 | 4,744,070 | 4,025,746 | 3,040,501 | 1,857,526 |
| බලපත්‍ර ගාස්තු | 536,550 | 826,475 | 826,475 | - | 230,000 | 689,605 | 689,605 | - |
| වෙනත් ආදායම් | 5,139,100 | 3,560,232 | 1,951,429 | 3,142,079 | 660,000 | 4,721,283 | - | 1,533,276 |
| එකතුව | 14,314,350 | 10,882,322 | 8,673,004 | 6,243,248 | 6,370,070 | 10,730,684 | 4,095,918 | 4,033,930 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය ආරම්භයේ සභාවේ සමස්ථ මුළු හිඟ ආදායම වූ රු.4,033,930 ක් වූ මුදලින් සියයට 14.5 ක් වන රු.585,412 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ රැස්කරගෙන තිබුණි. | හිඟ අදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,461,579 ක් හා මුද්දර ගාස්තු රු.1,680,500 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණා, විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රඹෑව ප්‍රාදේශීය සභාවේ පැරණි පුස්තකාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය රු.5,523,440 ක මුදලකට ඉටු කිරීම සදහා කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම්ගත වුවද රු.2,978,302 වැඩ පමණක් සිදුකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | කාර්යය සම්පූර්ණ කර නොතිබියදී වැඩ අවසන් බව දක්වා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්ව සම්බන්ධව කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | මෙම අරමුණු හා ඉලක්ක හඳුනාගෙන එය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුවේ. | ඉදිරිපත් කර නැත |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2014 ට පටහැනිව බඳවා ගෙන තිබුණු සේවකයින් 14 දෙනෙකු සඳහා 2014 ඔක්තෝබර් 24 දින සිට 2016 මැයි මස දක්වා රු.7,602,604 වැටුප් ගෙවීම සම්බන්ධ වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාකර නොතිබුණි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාල පාර්ශ්වයන්ගෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරිපත් කර නැත. |
| (ආ) | සභාව සතු වාහන 12 ක් සඳහා වසර ගණනාවක සිට ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | නියමිත දිනට ආදායම් බලපත්‍ර ලබා ගැනිමට කටයුුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත. |
| (ඇ) | සභාව සතු වාහන 07 ක් රක්ෂණය කර නොතිබුණි. | නියමිත දිනට රක්ෂණ සහතික ලබා ගැනීමට කටයුතු කල යුතු වේ | ඉදිරිපත් කර නැත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ තනතුරු 10 සඳහා නිලධාරීන් 21 දෙනෙකු පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු තනතුරු පිරවීමට පලාත් පාලන දෙපාර්තමේනතු සමග එක්ව කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් කඩකාමර 21 කින් 5ක් පමණක් වටිනාකම් තක්සේරු කර ලබාදී තිබුණු අතර ඉතිරි කඩ කාමර 16 තක්සේරු කිරීමකින් තොරව ලබාදී තිබුණි | කඩකාමර කුලිය තක්සේරු කර නව ගිවිසුම් අත්සන් කර ලබාදිය යුතු වේ. | ඉදිරිපත් කර නැත. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ඉඩම් 10 ක් හා සුසාන භූමි 45 ක්ද රු.83,167,973 ක් වටිනා වාහන 11 ක අයිතියද සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අයිති වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත. |

### 3.5.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වටිනාකම රු6,866,402 ක් වූ වත්කම් ඒකක 04 භාවිතයට නොගැනීම නිසා නිශ්කාර්යව පැවතුණි. | අලුත් වැඩියා කල හැකි වත්කම් අලුත් වැඩියා කිරීමටත් ඉතිරිය අපහරණය කිරීමටත් කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත. |

## 3.6 ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවරි 28 දිනැති අංක DMA/ 2009 (1)(i) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | ඉදිරිපත් කර නැත. |